# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 43 දරන ඉඩම් ප්‍රදාන
# (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1979 ජූනි මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 ජූනි මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ: ශත 80 යි　　　　තැපැල් ගාස්තුව: ශත 25 යි

# 1979 අංක 43 දරන ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූනි මස 25 වන දින]

එල්. ඩී.—ඔ. 29/79.

ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත සතු කරන ලද කෘෂිකාර්මික හෝ වතු ඉඩම් රජය සතු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද එසේ රජය සතු කරන ලද ඉඩම් අයිති කිරීමක් නොමැතිව ඉඩම් නොමැති තැනැත්තන් වෙත පැවරීමට හැකිවනු සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1979 අංක 43 දරන ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (1) ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත සතු කර ඇති යම් කෘෂිකාර්මික හෝ වතු ඉඩමක්— ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත සතුකර ඇති ඉඩම් රජය සතු කිරීමට අමාත්‍යවරයාට ඇති බලය.

(අ) රජයට තිබෙන ඉඩම් ප්‍රමාණය වැඩි කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් බෙදා දීමේ කාර්ය සඳහා ;

(ආ) ඉඩම් ප්‍රතිසංස්කරණ විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ; සහ

(ඇ) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නියමයකින්

අමාත්‍යවරයා විසින් රජය සතු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක ම—

(අ) ඒ නියමයෙන් රජය සතු කරන ලද කෘෂිකාර්මික හෝ වතු ඉඩමෙහි ප්‍රමාණය නිශ්චය කොට දක්වා තිබිය යුතු ය ;

(ආ) ඒ කෘෂිකාර්මික හෝ වතු ඉඩම වෙනුවෙන් මිනුම්පතිවරයා විසින් හෝ ඔහුගේ විධානය යටතේ හෝ සකස් කරන ලද මිනුම් පිඹුරෙහි යොමුව දක්වා තිබිය යුතු ය ; තව ද

(ඇ) ඒ කෘෂිකාර්මික හෝ වතු ඉඩමට අනුබද්ධ යම් පරවශතාවක් ඇත්නම් එය නිශ්චය කොට දක්වා තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක් ම, අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර, එය කිසියම් අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයකින් කිසියම් කෘෂිකාර්මික හෝ වතු ඉඩමක් රජය සතු කර ඇති අවස්ථාවක—

(අ) ඒ නියමයෙහි දිනයෙහි සිට ඒ කෘෂිකාර්මික හෝ වතු ඉඩම සම්බන්ධ (ඒ නියමයෙහි සඳහන් කිසියම් පරවශතාවක් හැර) සියලු බැඳීම්වලින් තොර පරම අයිතිය රජයට තිබිය යුතු ය ; තව ද

(ආ) ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ඒ කෘෂිකාර්මික හෝ වතු ඉඩම සම්බන්ධයෙන් ඒ කෘෂිකාර්මික හෝ වතු ඉඩමෙහි කලින් අයිතිකරුට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ගෙවිය යුතු වන්දි මුදලට සමාන ප්‍රමාණයක වන්දි මුදලක් ඒ කෘෂිකාර්මික හෝ වතු ඉඩම සම්බන්ධයෙන් රජය විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ගෙවිය යුතු ය.

මේ පනත යටතේ රජය සතු වන ඉඩම්, ජනාධිපතිවරයා විසින් අයකිරීමක් නොමැතිව පැවරිය හැකි බව.

3. 2 වන වගන්තිය යටතේ කරනු ලබන නියමයක් ප්‍රකාර රජය සතු කරන ලද යම් ඉඩමක යම් කොටසක් මෙහි උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ නියාදන සාධන පත්‍රයක් මගින්, වියස, අවුරුදු දහ අටකට වැඩි ශ්‍රී ලංකාවේ කිසියම් පුරවැසියකුට, අය කිරීමක් නොමැතිව, ජනාධිපතිවරයා විසින් පවරනු ලැබිය හැකි ය.

මේ වගන්තිය යටතේ රජයේ කිසියම් ඉඩමක් පැවරීමේ දී—

(අ) ශක්‍ය පැවරුම්ලාභීට ඉඩම් කිසිවක් අයිතිව නොතිබීම;

(ආ) ශක්‍ය පැවරුම්ලාභීගේ පවුලේ ආදායම් මට්ටම; සහ

(ඇ) ඒ ඉඩම සංවර්ධනය කිරීමෙහි ලා ශක්‍ය පැවරුම්ලාභීගේ හැකියාව

යන කරුණු කෙරෙහි ජනාධිපතිවරයා සැලකිලිමත් විය යුතු ය.

පැවරීමට පෙර ඉඩම මැනිම කළ යුතු බව.

4. රජයේ කිසිම ඉඩමක් ඒ ඉඩම, ඉඩම් කොමසාරිස්වරයා සෑහීමට පත් වන පරිදි මැන මායිම් ලකුණු කරනු ලැබීමෙන් පසුව මිස, 3 වන වගන්තිය යටතේ පැවරීම නොකළ යුතු ය.

පැවරීම් ඇතැම් කොන්දේසිවලට යටත් විය යුතු බව.

5. (1) 3 වන වගන්තිය යටතේ රජයේ සෑම ඉඩමක් පැවරීම, ඒ පැවරීම කරනු ලබන්නා වූ නියාදන සාධන පත්‍රයෙහි පහත දක්වෙන කොන්දේසි ඇතුළත් කර තිබුණ ද නොතිබුණ ද ඒ කොන්දේසිවලට යටත් ව ඇති ලෙස සලකනු ලැබිය යුතු ය:—

(අ) ඉඩම් කොමසාරිස්වරයාගේ ලියවිල්ලකින් වූ පූර්ව අනුමතය ඇතිව හැර, ඒ ඉඩම නියාදනය නොකළ යුතු ය;

(ආ) ඒ ඉඩම පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් කලින් කල නියම කරනු ලබන පස සංරක්ෂණය කිරීමේ කටයුතු පැවරුම්ලාභී විසින් ඒ ඉඩමෙහි සිදු කළ යුතු ය;

(ඇ) ඒ ඉඩමට පැවරුම්ලාභීට ඇති හිමිකම ඒ ඉඩමට සහබද්ධ යම් පරවශතාවකට යටත් විය යුතු ය;

(ඈ) එවැනි යම් පැවරීමකින් ඒ ඉඩමෙහි හෝ ඒ ඉඩම තුළ, එහි භූමිය මත ඇති යම් ඛනිජ ද්‍රව්‍යයකට යම් අයිතියක් නො පැවරෙන බව සැලකිය යුතු ය. තව ද එවැනි සෑම ඛනිජ ද්‍රව්‍යයක ම පරම අයිතිය ජනරජය සතුව පවතින ලෙස සැලකිය යුතු අතර ඒ ද්‍රව්‍යය එසේ පැවතිය යුතු ය;

(ඉ) වාරිමාර්ග ආඥාපනත යටතේ ඒ ඉඩම සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් වාරිමාර්ග බද්දක් ගෙවීමට පැවරුම්ලාභී යටත් විය යුතු ය;

(ඊ) මේ උපවගන්තිය ප්‍රකාර යම් කොන්දේසියකට ඒ පැවරීම යටත් වේ යයි සලකනු ලැබේ ද එවැනි කොන්දේසියක් අනුව කටයුතු කිරීම පැවරුම්ලාභී විසින් පැහැර හරිනු ලැබුව හොත් ඒ ඉඩමට ඔහුට ඇති හිමිකම රජයට ප්‍රතිවර්තනය වී රජය වෙත සතු වන්නේ ය ; තවද

(උ) ඒ ඉඩම නිසි ලෙස ප්‍රයෝජනයට ගැනීමේ සහ කළමනා කරණයේ සමෘද්ධිය පිණිස නියම කරනු ලැබිය හැකි වෙනත් කොන්දේසි.

(2) 3 වන වගන්තිය යටතේ රජයේ ඉඩමක යම් පැවරීමක් යම් කොන්දේසියකට යටත්ව ඇතැයි සලකනු ලැබේ ද එවැනි කොන්දේසියක් අනුව ක්‍රියා කිරීම හෝ එවැනි කොන්දේසියක් පිළිපැදීම හෝ පැහැර හැර ඇති බව ඔප්පු වූ විට, නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් වෙත ඉල්ලුම් කර, ඒ පවරාදීම කරනු ලැබුවා වූ නියාදන සාධන පත්‍රය අවලංගු කරන්නා වූ සහ සියලු බැඳීම්වලින් තොරව ඒ ඉඩම රජය සතු කරනු ලැබූ බව ප්‍රකාශ කරන්නා වූ ආඥාවක් ඒ අධිකරණයෙන් ලබා ගැනීමේ හිමිකම රජය සතු වන්නේ ය.

6. (1) 3 වන වගන්තිය යටතේ රජයේ ඉඩමක් පවරා දෙනු ලබන සෑම නියාදන සාධන පත්‍රයක් ම ජනාධිපතිවරයා විසින් ලියා අත්සන් කළ යුතු ය.

3 වන වගන්තිය යටතේ රජයේ ඉඩම් පවරා දෙනු ලබන්නා වූ නියාදන සාධන පත්‍ර ලියා අත්සන් කිරීම සහ ඒවා නිවැරදි බවට සහතික කිරීම.

(2) සුදුසුයයි ජනාධිපතිවරයා කල්පනා කරන්නේ නම්, එවැනි යම් නියාදන සාධන පත්‍රයක මුල් පිටපත අත්සන් කරනු වෙනුවට ඒ මත තම අත්සනෙහි ප්‍රතිරූපයක් මුද්‍රාපිත කිරීමට සැලැස්විය හැකිය. එසේ මුද්‍රාපිත යම් මුල් පිටපතක් ජනාධිපතිවරයා විසින් අත්සන් කරන ලද්දක් ලෙස සැලකිය යුතු ය.

(3) ජනාධිපතිවරයාගේ අත්සනෙහි ප්‍රතිරූපය නියාදන සාධන පත්‍රයෙහි මුල් පිටපතෙහි, ජනාධිපතිවරයාගේ ලේකම්වරයා හෝ තත් කාර්යය සඳහා ජනාධිපතිවරයා විසින් බලය දෙන ලද වෙනත් යම් නිලධරයකු හෝ විසින් නැතහොත් ඒ ලේකම්වරයා හෝ ඒ වෙනත් නිලධරයා හෝ ඉදිරිපිට දී හෝ මුද්‍රාපිත කළ යුතු ය. තව ද, ජනාධිපතිවරයාගේ ප්‍රතිරූප අත්සන ඒ නියාදන සාධන පත්‍රයෙහි මුල් පිටපතෙහි මුද්‍රාපිත කරන ලද්දේ තමා විසින් හෝ තමා ඉදිරිපිට දී හෝ බව, අවස්ථාවෝචිත පරිදි, ලේකම්වරයා නැතහොත් ඒ වෙනත් නිලධරයා විසින් ඒ මුල් පිටපතෙහි සහතික කළ යුතු ය.

7. (1) 6 වන වගන්තියට අනුකූලව අත්සන් කරන ලද හෝ අත්සන් කරන ලදැයි සලකනු ලබන හෝ සෑම නියාදන සාධන පත්‍රයක ම පිටපතක්, ඒ සාධන පත්‍රයෙන් පවරා දෙන ලද ඉඩම පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයාගේ අත්සනින්, එය නිවැරදි පිටපතක් බවට සහතික කරනු ලැබිය යුතු අතර, වාර්තාගත කර තැබීමේ කාර්යය සඳහා ඒ පිටපත, ඒ ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයේ තැන්පත් කර තැබිය යුතු ය.

3 වන වගන්තිය යටතේ රජයේ ඉඩම පවරා දෙනු ලබන්නා වූ නියාදන සාධන පත්‍රවල පිටපත් නිවැරදි බවට සහතික කිරීම.

(2) (1) වන උපවගන්තියේ දැක්වෙන පරිදි වූ යම් පිටපතක් නිවැරදි බවට ඒ උපවගන්තියේ සඳහන් කර ඇති ආකාරයට සහතික කර තිබේ නම්, සාක්ෂි ආඥාපනතේ 62 වන වගන්තියේ අර්ථානුකූලව, ඒ පිටපත, එය පිටපතක් වශයෙන් සලකනු ලබන සාධන පත්‍රය පිළිබඳව මූලික සාක්ෂි විය යුතු ය.

නියාදන සාධන පත්‍ර ලියාපදිංචි කිරීම.

8. 3 වන වගන්තිය යටතේ රජයේ ඉඩමක් පවරා දෙන සෑම නියාදන සාධන පත්‍රයක් ම, ඒ පවරා දීම කරනු ලැබීමෙන් පසු, ඒ ඉඩම පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයාගේ ඉල්ලීම පිට ලියාපදිංචි කරනු ලැබිය යුතු ය. ඒ ලියාපදිංචි කිරීම සඳහා කිසිදු ගාස්තුවක් ගෙවීම හෝ අයකිරීම හෝ නොකළ යුතු ය.

3 වන වගන්තිය යටතේ පවරා දෙන ලද රජයේ ඉඩමට අනුප්‍රාප්තිකයකු නම් කිරීම.

9. (1) (මේ උපවගන්තියෙහි "ප්‍රදානලාභී" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් රජයේ ඉඩමක් 3 වන වගන්තිය යටතේ පවරා දෙනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් හෝ, ඒ ඉඩම පිළිබඳව පළමුව සඳහන් කරනු ලැබූ තැනැත්තාගේ අයිතිවාසිකම් උරුම වී ඇත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් හෝ ප්‍රදානලාභී මියගිය කල්හි, ඒ ඉඩම පිළිබඳව ප්‍රදානලාභීගේ අයිතිවාසිකම්වලට, අනුප්‍රාප්තවීමට හිමිකම් තිබිය යුතු අනුප්‍රාප්තිකයකු නම් කරනු ලැබිය හැකිය. මේ උපවගන්තිය ප්‍රකාර කරනු ලබන නම් කිරීමක් 5(1) (අ) වගන්තියෙහි අර්ථානුකූලව නියාදනය කිරීමක් නොවන ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාර කරනු ලැබූ අනුප්‍රාප්තිකයකු නම් කිරීමක්, ඒ නම් කිරීම කරනු ලැබූ තැනැත්තා විසින් යම් අවස්ථාවක දී අවලංගු කරනු ලැබිය හැකි අතර, ඒ තැනැත්තා විසින් අනුප්‍රාප්තිකයකු පිළිබඳව අලුත් නම් කිරීමක් කරනු ලැබිය හැකි ය.

(3) රජයේ ඉඩම 3 වන වගන්තිය යටතේ පවරා දෙනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් හෝ, ඒ ඉඩම පිළිබඳව පළමුව සඳහන් තැනැත්තාගේ අයිතිවාසිකම් උරුම වී ඇත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් හෝ අනුප්‍රාප්තිකයකු නම් කිරීම සහ එවැනි යම් නම් කිරීමක් අවලංගු කිරීම—

(අ) දිසාපතිවරයකු, ඉඩම් රෙජිස්ට්‍රාර්වරයකු, නොතාරිස්වරයකු නැතහොත් සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී සාක්ෂි සහිතව ලියා අත්සන් කරනු ලැබූ නියමිත ආකෘතියට සාරානුකූල වූ, පිටපත් දෙකකින් යුත් ලේඛනයක් මගින් ; හෝ

(ආ) තමාගේ අන්තිම කැමති පත්‍රය මගින්,

කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ (අ) ඡේදයට අනුව කරනු ලැබූ නම් කිරීමකට සහ නම් කිරීමක් සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනතෙහි 6 වන වගන්තියේ (4) වන, (5) වන, (6) වන, (7) වන සහ (9) වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(5) (3) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් ලේඛනයක් ලියාපදිංචි කිරීම සඳහා කාර්ය පටිපාටිය නියම කිරීමෙහිලා නියෝග සාදනු ලැබිය හැකි ය.

9 වන වගන්තිය යටතේ නම් කිරීමක් නොමැති විට 3 වන වගන්තිය යටතේ පවරා දෙනු ලැබූ රජයේ ඉඩමක අයිතිවාසිකම් උරුමවීම.

**10.** (මේ වගන්තියෙහි "ප්‍රදානලාභී" යනුවෙන් සඳහන් කරනු ලබන), රජයේ ඉඩමක් 3 වන වගන්තිය යටතේ පවරා දෙනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා හෝ, පළමුව සඳහන් තැනැත්තාගේ අයිතිවාසිකම් උරුම වී ඇත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා හෝ මිය යන්නාවූ ද, ප්‍රදානලාභී විසින් 9 වන වගන්තිය යටතේ අනුප්‍රාප්තිකයකු නම් කරනු නොලැබුවා වූ හෝ, ප්‍රදානලාභී විසින් ඒ වගන්තිය යටතේ නම් කරන ලද අනුප්‍රාප්තිකයා මියගොස් ඇත්තාවූ ද අවස්ථාවක, ඒ ඉඩමෙහි ප්‍රදානලාභීගේ අයිතිවාසිකම් ජීවත්ව සිටින පුරුෂයාට හෝ භාර්යාවට උරුම විය යුතු ය. තවද, එවැනි පුරුෂයකු හෝ භාර්යාවක නොමැති විට පහත දැක්වෙන පිළිවෙල, එනම් :—

(1) පුත්‍රයන්

(2) දියණියන්

(3) මුණුපුරන්

(4) මිණිපිරියන්

(5) පියා

(6) මව

(7) සහෝදරයන්

(8) සහෝදරියන්

(9) මාමලා

(10) නැන්දලා

(11) බෑනලා

(12) ලේලිලා

අනුව, ප්‍රදානලාභීගේ ඥාතිවරුන්ගෙන් එක් කෙනකුට පමණක් උරුම විය යුතු අතර, යම් කාණ්ඩයමක ඥාතීන් දෙදෙනකුට වැඩි ගණනක් සිටින අවස්ථාවක, වැඩිමහල් ම ඥාතියාට මනාපය දැක්විය යුතු ය. යම් කාණ්ඩයමක ඥාතීන් දෙදෙනකු පමණක් සිටින අවස්ථාවක ඒ දෙදෙනාගෙන් වඩා වැඩිමහල් ඥාතියාට මනාපය දැක්විය යුතු ය.

මේ වගන්තියෙහි "ඥාතියා" යන්නෙන්, විවාහයෙන් ඇති වන ඥාතියකු නොව ලේ ඥාතියෙක් අදහස් වේ.

3 වන වගන්තිය යටතේ වූ පැවරීමක් යම් කොන්දේසියකට යටත් වන්නේ යයි සලකනු ලැබේද ඒ කොන්දේසි ඒ ඉඩම සමග පැවතිය යුතු බව.

**11.** 3 වන වගන්තිය යටතේ වූ රජයේ යම් ඉඩම් පවරාදීමක් යම් කොන්දේසියකට යටත් වන්නේ යයි සලකනු ලැබේද ඒ කොන්දේසියෙහි භාරය ඒ ඉඩම සමග පැවතිය යුතු අතර, පැවරුම්ලාභී ද, ඒ පැවරුම්ලාභී මඟින්, ඔහුගෙන් හෝ ඔහු යටතේ ඒ ඉඩමට හිමිකම් දක්වන සියලු තැනැත්තන් ද ඒ කොන්දේසිවලින් බැඳී සිටිය යුතු ය.

3 වන වගන්තිය යටතේ පවරා දෙන ලද ඉඩමක් ඉඩම් කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමතය නොමැතිව නියාදනය කිරීම ශූන්‍ය සහ බලරහිත බව.

12. 3 වන වගන්තිය යටතේ රජයේ ඉඩමක් යම් තැනැත්ත කුට පවරා දෙනු ලැබුවේද ඒ තැනැත්තා විසින්, 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධානවලට අනුව ඉඩම් කොමසාරිස්වරයා විසින් දෙනු ලබන පූර්ව ලිඛිත අනුමතය ලබා නොගෙන ඒ ඉඩම නියාදනය කරනු ලැබුවහොත් ඒ නියාදනය කිරීම සියලු කාර්ය සඳහා ශූන්‍ය හා බලරහිත විය යුතු ය.

නියාදන සාධන පත්‍රයෙහි දෝෂ ආදිය නිවැරදි කිරීම.

13. 3 වන වගන්තිය යටතේ රජයේ ඉඩමක් පවරා දෙන ලද යම් නියාදන සාධන පත්‍රයක යම් ලිපි දෝෂයක් හෝ වෙනත් දෝෂයක් හෝ ඇති බව නැතහොත් එහි ඇතුළත් ඉඩමේ විස්තරය සම්බන්ධයෙන් හෝ, පැවරුම්ලාභීගේ නම හෝ අභිධානය හෝ සටහන් කිරීම නැතහොත් විස්තර කිරීම සම්බන්ධයෙන් එසේත් නැතහොත් වෙනත් වැදගත් කරුණක් සම්බන්ධයෙන් ඒ සාධන පත්‍රයෙහි සංශෝධනයක් කළ යුතුව ඇති බව ඒ ඉඩම පිහිටි පරි පාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයාට පෙනී යන අවස්ථාවක දී, ඒ සාධන පත්‍රයෙහි පිටසනක් කර ඒ දිසාපතිවරයා සහ පැවරුම්ලාභී විසින් අත්සන් කිරීමෙන් ඒ දෝෂය නිවැරදි කිරීම හෝ ඒ සංශෝ ධනය කිරීම හෝ කළ හැකි ය. ඒ දෝෂය නිවැරදි කිරීම හෝ ඒ සංශෝධනය කිරීම හෝ සඳහා එසේ අත්සන් කරන ලද යම් පිටසනක් සියලු කාර්ය සඳහා ප්‍රමාණවත් වන අතර, ඒ පිටසන කරනු ලැබූ සාධන පත්‍රය, එය ඒ ආකාරයෙන් නිවැරදි කර හෝ සංශෝධනය කර හෝ මුලින් ම නිකුත් කරන ලද්දක් නැතහොත් ලියා අත්සන් කරන ලද්දක් මෙන් බලපැවැත්විය යුතු ය.

3 වන වගන්තිය යටතේ පවරා දෙනු ලැබූ යම් ඉඩමකට යම් දියළු හෝ වෙනත් උපචයනය.

14. 3 වන වගන්තිය යටතේ පවරා දෙනු ලැබූ රජයේ ඉඩමකට එකතු වූ යම් දියළු හෝ වෙනත් උපචයනය ඒ උපචයනයට අදාළ හෝ අයිති සියලුම අයිතිවාසිකම් සමග, ජනරජයේ දේපළ විය යුතු අතර, ඒ සියලු උපචයනය ජනරජය වෙත සතු විය යුතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

3 වන වගන්තිය යටතේ පවරා දෙනු ලැබූ රජයේ යම් ඉඩමක් පරීක්ෂා කිරීමේ බලය.

15. 3 වන වගන්තිය යටතේ පවරා දෙනු ලැබූ රජයේ යම් ඉඩ මක් පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් හෝ, ඒ දිසාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින්, ඒ පැවරීම යටත් වන යම් කොන්දේසියක් පිළිපදිනු ලැබ ඇත්තේ ද යන වග නිශ්චය කිරීමේ කාර්ය සඳහා, කවර හෝ වේලාවක ඒ ඉඩමට ඇතුළු වී පරීක්ෂා කළ හැකි ය.

මේ පනතේ කාර්ය පරිපාලනය.

16. (1) මේ පනතේ කාර්ය පරිපාලනය පිළිබඳව ඉඩම් කොම සාරිස්වරයා වගකිව යුතු අතර ඒ කාර්යය ඔහුට භාර කළ යුතු ය.

(2) මේ පනත යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ තම කාර්ය ඉටු කිරීමේ දී ඉඩම් කොමසාරිස්වරයා, අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව, ක්‍රියා කළ යුතු ය.

සැක සහිත අවස්ථාවල ඉඩම් කොමසාරිස්වරයා වෙත යොමු කිරීම.

**17.** (1) මේ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නැත හොත් ක්‍රියාත්මක කිරීම පිළිබඳව යම් කාර්ය භාර කරනු ලැබ සිටින යම් රජයේ නිලධරයකු විසින්, ඒ කාර්ය ඉටු කිරීම හා සම් බන්ධ සැක සහිත හෝ දුෂ්කර යම් ප්‍රශ්නයක් තීරණය කරනු ලැබීම සඳහා ඉඩම් කොමසාරිස්වරයා වෙත සිය මෙහෙයවීමෙන් ම හෝ ඉඩම් කොමසාරිස්වරයාගේ ඉල්ලීම පිට හෝ ඉඩම් කොම සාරිස්වරයා වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(2) ඉඩම් කොමසාරිස්වරයාගේ යම් විධානයකට හෝ තීරණයකට අනුකූලව නිසි පරිදි ක්‍රියා කිරීම හෝ ඒ තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ඒ සෑම රජයේ නිලධරයකු විසින්ම කළ යුතු ය.

නියෝග.

**18.** (1) නියෝග සාදනු ලැබීමට මේ පනත යටතේ නියම කරනු ලබන සියලු කාරණාවලට නැතහොත් කාරණාවලින් කිසිවකට අදාළ ව අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයෙහි හෝ ඒ නියෝගයෙහි සඳහන් කරනු ලබන යම් පසු දින යක හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතියේ දින සිට එහෙත් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

මේ පනතේ විධිවිධාන වෙනත් යම් නීතියක් අභිබවා බල පැවැත් විය යුතු බව.

**19.** වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක විය යුතු අතර, ඒ අනුව, මේ පනතේ විධිවිධාන හා එකී වෙනත් යම් ලිඛිත නීතියේ විධිවිධාන අතර යම් ගැටීමක් හෝ අනනුකූලතාවක් ඇති වුවහොත්, මේ පනතේ විධි විධාන එකී වෙනත් ලිඛිත නීතියේ විධිවිධාන අභිබවා බලපැවැත් විය යුතු ය.

අර්ථ නිරූපණය.

**20.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"කෘෂිකාර්මික ඉඩම" යන්නෙහි ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"වතු ඉඩම" යන්නෙහි, ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"නියාදනය" යන්නෙහි ව්‍යාකරණානුකූල ප්‍රභේද සහ සජාතීය යෙදුම් ද සමග ඒ යෙදුමෙන් ඉඩම්වලට හෝ ඉඩම්වලට ඇති හිමිකම කෙරෙහි බලපාන කවර ස්වභාවයක වූ හෝ ගනුදෙනුවක් අදහස් වන අතර එයට ඉඩමක් සම්බන්ධ

යෙන් වූ හිමිකරයක්, පැවරීමක්, භාරදීමක්, හුවමාරුවක්, බද්දක් නැතහොත් උකසක් හෝ ඉඩම්වලට අදාළව භාරයක් ඇතිකිරීමක් ද ඇතුළත් වේ ;

"ඉඩම් කොමසාරිස්වරයා" යන්නෙන් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ පත් කරන ලද ඉඩම් කොමසාරිස්වරයා අදහස් වේ ;

"ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව" යන්නෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අදහස් වේ ;

"ඉඩම් ප්‍රතිසංස්කරණ පනත" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 39 දරන පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අදහස් වේ ;

"නියමිත" යන්නෙන් 18 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග මගින් නියමිත බව අදහස් වේ ;

"ඛනිජ ද්‍රව්‍ය" යන්නෙහි, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 4 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

උපලේඛනය

(3 වන වගන්තිය)

**1979 ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය යටතේ ඉඩම් පවරා දෙන නියාදන සාධන පත්‍රය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ........................................................................ වන මම, මෙහි පළමුවන උපලේඛනයෙහි විස්තර කොට ඇති රජයේ ඉඩම, මෙහි දෙවන උපලේඛනයෙහි දක්වා ඇති කොන්දේසිවලට ද, 1979 ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන වලට ද යටත් ව, (මෙහි මින් මතු පැවරුම්ලාභී යනුවෙන් සඳහන් කරනු ලබන) ........................................................................ වෙත අයකිරීමක් නොමැතිව මෙයින් පවරා දෙමි.

2. මෙහි දෙවන උපලේඛනයෙහි දක්වා ඇති කොන්දේසිවලින් කිසිවකට හෝ 1979 ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතෙහි විධිවිධාන කිසිවකට හෝ අනුකූලව කටයුතු කිරීම පැවරුම්ලාභී විසින් පැහැර හරිනු ලැබුවහොත් මේ සාධන පත්‍රය මගින් පවරන ලද ඉඩමෙහි හිමිකම රජයට ප්‍රතිවර්තනය විය යුතු අතර, රජය වෙත සතු විය යුතු ය.

19...... ක් වූ ............................ මස ......... වන දින වූ මෙදින මගේ අත්සන යටතේ ප්‍රදානය කරන ලදී.

ජනාධිපතිවරයාගේ අත්සනෙහි ඉහත දැක්වෙන ප්‍රතිරූපය මා විසින්/මා ඉදිරිපිට දී මෙහි මුද්‍රපිත කළ බව 1979 ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතේ 6(3) වන වගන්තිය යටතේ මම සහතික කරමි.

ජනාධිපතිවරයාගේ ලේකම්.

පළමුවන උපලේඛනය

දෙවන උපලේඛනය

3—ඒ 42078 (79/05)